# වරකාපොල ප්‍රාදේශීය සභාව
# ප්‍රසම්පාදන ( ටෙන්ඩර් ) දැන්වීමයි

## 2023.06.01 දින සිට 2023.12.31 දින දක්වා වරකාපොල සතිපොල භූමියේ කඩ කාමර අංක 05 කුකුල් මස් 02 කඩය බදු ලබා දීම.

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව වරකාපොල ප්‍රාදේශීය සභාවට අයත් පහත උපලේඛණයේ සඳහන් මස් කඩය 2023.06.01 දින සිට 2023.12.31 දක්වා බදු දීම පිණිස මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත් 2023.05.10 දින පෙ.ව 10.00 දක්වා මා විසින් භාර ගනු ලැබේ.
ටෙන්ඩර් ආකෘති පත්‍ර 2023.04.18 දින සිට 2023.05.09 දින ප.ව 3.00 දක්වා නිකුත් කරනු ලැබේ.ඒ සඳහා කරනු ලබන ගෙවීම් මුදලින් පමණක් කල යුතු අතර තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කල යුතුය.
නියමිත ගාස්තු ගෙවා ලබා ගනු ලබන ටෙන්ඩර් ආකෘති පත්‍ර අයදුම්පත් දෙකකින් යුතුව සම්පූර්ණ කොට මුල් පිටපත හා අනු පිටපත ලෙස වෙන වෙනම තමන් මිළදී ගැනීමට අපේක්ෂිත කඩ කාමර අංකය සහ කඩ කාමරයේ නම ලිපි කවරයන්හි වම් පස ඉහළ කෙළවරේ අනිවාර්යෙන් සඳහන් කර ලියුම් කවර 02 ක බහා මුද්‍රා තබා 2023.05.10 වන දින පෙ.ව 10.00 ට පෙර අතින් ගෙනවිත් භාර දීම හෝ ටෙන්ඩර් පෙට්ටියේ බහාලීම හෝ ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට එවිය යුතුය.
ටෙන්ඩර් විවෘත කිරීම 2023.05.10 වන දින පෙ.ව 10.15 ට ප්‍රාදේශීය සභා කාර්යාලයේදී සිදු කෙරේ. ටෙන්ඩර් කොන්දේසි හා වැඩි විස්තර මෙම කාර්යාලයෙන් විමසා දැන ගත හැකිය.

2023.04.17
වරකාපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේදීය .
දුරකථන අංකය - 035-2267275

ඩී.එම්.එම්.පී.දුනුසිංහ
ලේකම් හා බලතල, කාර්ය කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
වරකාපොල ප්‍රාදේශීය සභාව.

**උපලේඛනය 1**

**වරකාපොල සතිපොල භූමිය**

| අනු අංකය | ස්ථානය | ආකෘති පත්‍ර ගාස්තුව | ටෙන්ඩර් ඇප මුදල (රුපියල්) | අවම ලංසුව (රුපියල්) |
|---|---|---|---|---|
| 01 | කඩ කාමර අංක 05 කුකුල් මස් 02 කඩය | 1500.00 | 7000.00 | 263916.87 |

වරකාපොළ ප්‍රාදේශීය සභාව
வரகாபொல பிரதேச சபை
Warakapola Pradeshiya Sabawa